**මීගමුව අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම-2025**

**පුරවැසි අධ්‍යාපනය**

**විභාග අංකය / නම :** ..........................................................................................................................................

| 7 ශ්‍රේණිය | | කාලය පැය 02 |
|---|---|---|

## 1 කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ.**

- **1 සිට10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

01. සමාජයක කුඩාම හා වැදගත්ම ඒකකය වන්නේ,
   1. පාසලයි  2. පන්සලයි
   3. පවුලයි  4. සමාජ සංවිධානයයි

02. වර්තමාන සමාජයේ සුලබව දැකිය හැකි පවුල් ඒකකය වන්නේ,
   1. විස්තෘත පවුලයි  2. න්‍යෂ්ටික පවුලයි
   3. ස්ථාවර පවුලයි  4. ඥාති පවුලයි

03. පුද්ගලයෙකු තුළ ඇතිවිය හැකි යහපත් චිත්තවේග තත්වයක් වන්නේ මින් කුමක් ද?
   1. කෝපය  2. බිය  3. කරුණාව  4. දුක

04. පාසල ශිෂ්‍යයෙකු ලෙස තම ජීවිත අරමුණු සාර්ථක කරගැනීම සඳහා ඔබ කළ යුතු වන්නේ,
   1. තමා කැමති විෂයන් පමණක් හොඳින් පාඩම් කිරීම ය.
   2. හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වීමය.
   3. කාල සටහනකට අනුව වැඩකටයුතු නොකිරීමය.
   4. වැඩි කාලයක් ක්‍රීඩාවේ නිරත වීමය.

05. දත්ත හා තොතුරුවලට අයත් වන්නේ,
   1. ජීවන අත්දැකීම් පමණි  2. ලිඛිත දේ පමණි
   3. ලිඛිත හා ජීවන අත්දැකීම් වේ  4. ඉහත කිසිවක් නොවේ

06. පවුලේ සාමාජිකයෙකු ලෙස ඔබගේ යුතුකමක් හා වගකීමක් වන්නේ,
   1. පවුලේ ගෞරවය ආරක්ෂා කිරීමය.  2. ආහාර හා පෝෂණය ලැබීමය.
   3. අධ්‍යාපනය ලැබීමය.  4. රැකවරණය ලැබීමය.

07. පහත සඳහන් යුතුකම් අතරින් සදාචාරාත්මක යුතුකමක් වන්නේ,
   1. බදු ගෙවීමය  2. වැඩිහිටියන්ට සැලකීමයි
   3. රජයට අවනත වීමය  4. රාජකාරිය නිසි ලෙස ඉටුකිරීමය

08. ඇසුරුම් කරන ලද භාණ්ඩයක් මිලදී ගැනීමේදී සැලකිය යුතු කරුණක් විය යුත්තේ,

1. කල් ඉකුත්වීමේ දිනයයි
2. ශුද්ධ බරයි
3. අඩු මුදලට වැඩි ප්‍රමාණයක් මිලදී ගත හැකි වීමයි.
4. ගුණාත්මකභාවයට වඩා රස පිළිබඳ අවධානය යොමුකිරීමය

09. අන්තර් සබඳතාවල පදනම ආරම්භ වන්නේ,

1. සමාජය තුළිනි
2. පාසල තුළිනි
3. ආගමික මධ්‍යස්ථාන තුළිනි
4. පවුල තුළිනි

10. ක්‍රීඩාවල නිරතවීමෙන් පුද්ගලයා තුල වර්ධනය වන ගුණාංගයක් නොවන්නේ,

1. නීතිගරුක වීම
2. ජය හා පරාජය සතුටින් විඳදරා ගැනීම.
3. දුක හා ශෝකය
4. වින්දනය හා සතුට

- **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (x ) ලකුණද වරහන් තුළ යොදන්න.**

11. සැම පවුලකම දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ විශාල සාමාජිකයන් සංඛ්‍යාවක් සිටීමයි.(  )

12. පුද්ගලයෙකු සතු සුවිශේෂී හැකියාවන් ඔහුගේ අනන්‍යතාවය පෙන්නුම් කරන ලක්ෂණයකි.(  )

13. ඕනෑම ප්‍රශ්නයක දී හෝ ගැටලුවක දී ඒ සඳහා ඇත්තේ එකම විසඳුමක් පමණි. (  )

14. සිත තුළ ඇතිවන චිත්තවේග මුහුණින් හඳුනාගත නොහැක. (  )

15. සම්ප්‍රදායන් හා ආදර්ශයන් බාල පරපුරට උරුම කරලීමට ඥාතීන්ගේ ඇසුර බෙහෙවින් බලපායි.(  )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

16. ආගමික කටයුතුවල නිරතවීම .......................... පාලනය කිරිමට ඇති හිතකර ක්‍රමයකි..

17. බුද්ධිමත් පාරිභෝගිකයන් වෙනස් වන ......................... හමුවේ විචාරශීලිව කටයුතු කළ යුතුය..

18. ජන සමාජය මඟින් පුද්ගලයාට නැත්නම් තමන්ට ලබා දී ඇති වරප්‍රසාදයන් ......................... වේ. .

19. හැකියාවන් හා දක්ෂතාවයන් වර්ධනයට උපකාර වන වැඩසටහන් භාවිතයට පුරුදුවීම .................... බෙහෙවින් උපකාරී වේ.

20. කිසියම් විෂය ක්ෂේත්‍රයක් හා සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍ර ....................... නමින් හැඳින්වේ.

( දත්ත, අයිතිවාසිකම්, සාර්ථකත්වයට, වෙළඳපොළ, චිත්ත පීඩා, යුතුකම් )

**(ලකුණු 2 x20 = 40)**

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

**01.**

I. පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත්ව වීම නිසා අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.

II. චිත්තවේගී අවස්ථා දෙකකට උදාහරණ ලියන්න.

III. අසල්වාසීන් සමග සුහදව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න.

IV. තොරතුරු ලබාගත හැකි විද්‍යුත් මාධ්‍ය දෙකක් නම් කරන්න.

V. පාසලේ සංවර්ධනය සඳහා තොරතුරු පවත්වා ගැනීම තුළින් අත්වන වාසි දෙකක් ලියන්න

VI. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ මුහුණ දෙන අභියෝග දෙකක් ලියන්න.

VII. කෘෂිකාර්මික අංශයට අයත් රැකියා දෙකක් ලියන්න.

VIII. යුතුකම් වර්ග දෙක දක්වන්න. **(ලකුණු 16)**

**02.**

I. අපගේ සිතේ ඇතිවන සරල පීඩාවන් දෙකක් ලියන්න. (ල 02)

II. අයහපත් චිත්ත පීඩා පාලනය කර ගැනීමට ඔබට කළ හැකි සරල ක්‍රියාකාරකම් හතරක් ලියන්න. (ල 04)

III. චිත්ත පීඩා පාලනය කර ගැනීමට නොහැකිවීමෙන් මුහුණ දීමට සිදුවන අහිතකර ප්‍රතිඵල දෙකක් ලියන්න. ඉන් එකක් පැහැදිලි කරන්න. (ල 05)

**03.**

I. අභියෝග වලට මුහුණ දීම සඳහා ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග දෙකක් ලියන්න. (ල 02)

II. වර්තමාන සමාජයේ සාමාජිකයින් මුහුණ දෙන අභියෝග අවස්ථා හතරක් නම් කරන්න. (ල 04)

III. අභියෝග සාර්ථකව ජයගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ පැහැදිලි කරන්න. (ල 05)

**04.**

I. පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් ලියන්න. (ල 02)

II. පවුල තුළ පවත්වාගෙන යනු ලබන සම්ප්‍රදායන් හතරක් ලියන්න. (ල 04)

III. පවුලක් තුළ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් රැක ගැනීමේ වැදගත්කම් තුනක් ලියා ඉන්න එකක් පැහැදිලි කරන්න. (ල 05)

**05.**

I. දරුවෙකු මුලින්ම අන්තර් සම්බන්ධතා ඇතිකර ගන්නා පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න. (ල 02)

II. ළමා ශ්‍රමිකයින් සේවයෙහි යෙදවීමෙන් ළමයින්ට ඇතිවන අහිතකර බලපෑම් හතරක් ලියන්න. (ල 04)

III. ළමයින් හා සම්බන්ධ සමාජ වගකීම් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.(ල 05)

**06.**

I. ජන සමාජයේ යහපත් පුද්ගලයකු ලෙස ජීවත්වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න. (ල 02)

II. පුද්ගලයකුට හිමි සිවිල් අයිතිවාසිකම් දෙකක් හා දේශපාලන අයිතිවාසිකම් දෙකක් ලියන්න. (ල 04)

III. සමාජයේ යහපත වෙනුවෙන් ඔබට කළ හැකි යුතුකම් තුනක් ලියන්න. ඉන් එකක් විස්තර කරන්න. (ල 05)

**07.**

I. ඔබෙන් පවුලේ සාමාජිකයින්ට ඉටු විය යුතු යුතුකම් දෙකක් ලියන්න. (ල 02)

II. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් හතරක් ලියන්න. (ල 04)

III. යහපත් පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග පහක් ලියන්න. (ල 05)